*සැ. යු.*- 2021.09.03 දින පළ වූ අංක 2,244 දරන *ගැසට් පත්‍රයේ* III කොටස පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,245 - 2021 සැප්තැම්බර් මස 10 වැනි සිකුරාදා - 2021.09.10**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම ... ... ... | 512 |
| බූදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2021 ඔක්තෝබර් මස 01 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2021 සැප්තැම්බර් මස 17 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපැලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

**"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."**

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2021 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# පිස්කල් විකිණීම්

## සිවිල් නඩු විධාන සංග්‍රහයේ 255 වන වගන්තියට අනුව පිස්කල් විසින් කරනු ලබන පිස්කල් විකිණීම
## හිඟුරක්ගොඩ දිසා අධිකරණයේ දී ය

### සෙලාන් බැන්ක් පීඑල්සී

(කලින් සෙලාන් බැන්ක් ලිමිටඩ් යනුවෙන් හඳුන්වන ලද) සෙලාන් ටවර්ස්, අංක 90, ගාලු පාර, කොළඹ 03.

*නඩු අංකය* : 29/MB/2016
*ස්වභාවය* : *උකස්*
*වටිනාකම* : *රු.* 4,190,250.40
*ඇස්කීසි අංකය* :

.......................*පැමිණිලිකරු.*

*එදිරිව*

1. ඇතුගල්ගේ දිමුතු චලන් කුමාර
2. රානරාජ සෙනරත් සේනාධිපතිගේ තුෂාරි නිරෝෂිකා රණසිංහ

*දෙදෙනාම*

15 ඇල, නෙල් මාවත, හිඟුරක්ගොඩ.

......................*විත්තිකරුවන්.*

හිඟුරක්ගොඩ දිසා අධිකරණයේ ඉහත අංක දරන නඩුවේ වර්ෂ 2019ක් වූ ජූලි මස 04 වැනි දින ලබාදෙන ලද ඒකපාක්ෂික නඩු තීන්දුව අනුව විත්තිකරුවන් විසින් පැමිණිලිකාර බැංකුව වෙත ගෙවිය යුතු රුපියල් ලක්ෂ විස්සක (රු. 2,000,000/-) ස්ථිර අයිරා පහසුකම් මත වර්ෂ 2016.07.27 වන දින වන විට රුපියල් විසිහතර ලක්ෂ හැත්තෑදෙදහස් හාරසිය පනස් පහයි ශත පනස් පහයි (රු. 2,472,455.55) මුදලක් සහ එකී මුදල මත වර්ෂ 2016.07.28 වන දින සිට සම්පූර්ණයෙන් ගෙවා අවසන් වන දින තෙක් වසරකට සියයට විසිහතරක් (24%) බැගින් වාර්ෂික පොළිය ද,

රු. 2,000,000ක කාලීන ණය පහසුකම් මත වර්ෂ 2016.07.27 වන දින වන විට රුපියල් දහත් ලක්ෂ දහත් දහස් හත්සිය අනූ හතරයි ශත අසූ පහක (රු. 1,717,794.85) මුදලක් සහ රුපියල් දහතුන් ලක්ෂ හැට දෙදහස් අටසිය හැත්තෑ හයයි ශත තුනක (රු. 1,362,876.03) මුදල මත වර්ෂ 2016.07.28 වැනි දින සිට සම්පූර්ණයෙන් ගෙවා අවසන් වන දින තෙක් වසරකට සියයට විසි දෙකක් (22%) බැගින් වූ වාර්ෂික පොලියක් ද ගෙවිය යුතු බවටත්, නඩු ගාස්තු ද ගෙවිය යුතු බවට නියෝග කොට ඇති හෙයින් ද, ඒ අනුව ඉහත නම සඳහන් විත්තිකරුවන්ට අයත් දැනටමත් තහනමට ගෙන ඇති පහත උපලේඛණයේ සඳහන් වන දේපල පිස්කල් වෙන්දේසියේ විකුණා පැමිණිලිකාර බැංකුවට අයකර දීම සඳහා,

වර්ෂ 2021ක් වූ ඔක්තෝබර් මස 07 වැනි දින ප. ව. 1.00ට එම දේපල පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

### *උපලේඛනය*

උතුරු මැද පළාතේ, පොලොන්නරුව දිස්ත්‍රික්කයේ, සිංහල පත්තුවේ, හිඟුරක්ගොඩ ප්‍රාදේශීය සභා සීමාව තුළ, හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 54 දරන සී පී. පුර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ සී. පී. පුර ගමේ පිහිටි ඉඩම් කොටස සඳහා මායිම්,

උතුරට : එස්. කේ. කමලාවතීට අයති ඉඩම ද,
නැගෙනහිරට : ප්‍රධාන පාර ද,
දකුණට : දුම්කොළ ඩිපෝව ඉඩම ද,
බස්නාහිරට : කුණු ඇළ ද

යන මායිම් ප්‍රමාණයෙන් රූඩ් දෙකක් (අ. 0, රූ. 2, පර්. 0) විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි සියලු දේ සමග ඉඩම. මෙම ඉඩම පොලොන්නරුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්ඉරු 2/1/294 සහ වෙළුම්/පත්ඉරුව LDO/G/3/59 හි ලියාපදිංචි වී ඇත.

ඉහත විස්තර කරන ලද ඉඩම නැවත මැනීමකින් පසු පහත පරිදි වේ.

උතුරුමැද පළාතේ, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, සිංහල පත්තුවේ, හිඟුරක්ගොඩ ප්‍රාදේශීය සභා සීමාව තුළ, හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 54 දරන C.P. පුර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ C.P. පුර ගමේ පිහිටි වර්ෂ 2013.10.07 දිනැති අංක NCP/HG/LO5/1947 දරන හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතිය ලත් ලිපිය මගින් (වර්ෂ 2013.09.01 දිනැති අංක 352 දරන සර්වෙයර් ජනරාල් විසින් මැන සාදන ලද ලොට් F. T. P 9 හි ඉතිරි කොටස (ජයභූමි ඔප්පු අංක PO/PRa/HINGU/1337) බලයලත් මිනින්දෝරු අයි. එච්. එම්. එස්. ජේ. බී. හේරත් මහතා විසින් මැන බෙද වෙන්කර සාදන ලද අංක 1465 සහ වර්ෂ 2013.09.08 වන දින දරන පිඹුරෙහි සඳහන් ලොට් 1 දරන ඉඩම් කොටස සඳහා මායිම්,

උතුරට : Ro පාර ද,<br>
නැගෙනහිරට : ප්‍රධාන පාර සඳහා වෙන් කළ කොටස ද,<br>
දකුණට : දුම්කොළ ඩිපෝව ඉඩම ද,<br>
බස්නාහිරට : ඩබ්. ඒ. සිරිපාලට අයිති ඉඩම ද,

යන මායිම් වූ ප්‍රමාණයෙන් රූඩ් දෙකක් (අ. 0, රූ. 2, පර්. 0) හෙවත් හෙක්ටයාර් 0.02024ක් විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි, ගස්, වැවිලි, බෝග සහ සියලු දේ සමග ඉඩම.

*දේපලට පිවිසීම.*-මින්නේරිය කඩවීදියේ සිට පොලොන්නරුව ප්‍රධාන පාරෙන් කි. මී. 4.30 ක් C.P. ග්‍රාමය දක්වා පැමිණි (54/1 කණුව අසල) දකුණු පසින් වන්නට මෙම දේපල පිහිටා ඇත.

*ගෙවීම් ක්‍රමය.*- වෙන්දේසිය අවසානයේ දී සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය. (1) ගැණුම් මිලෙන් 25%, (2) පළාත් අධිකාරියේ බදු සඳහා 1%, (3) ප්‍රචාරණ වියදම්, (4) සිවිල් නඩු විධාන සංග්‍රහයේ අංක 258 වගන්තියේ (අ) යටතේ අයකිරීම් ද, ගැණුම් මිලෙන් 75%ක් වූ ඉතිරිය වෙන්දේසි දින සිට දින 30ක් ඇතුලත හිඟුරක්ගොඩ දිසා අධිකරණයේ ඉහත නඩුවට බැර කළ යුතු ය. ඉහත සඳහන් පරිදි ඉතිරි මුදල් නියමිත කාලසීමාව ඇතුලත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති මුදල් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපල විකිණීමට පැමිණිලිකරුට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වෙනත් වැඩිදුර විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න. අංශ ප්‍රධානී - නීති, සෙලාන් බැන්ක් පීඑල්සී - අංක 90, ගාලු පාර, කොළඹ 3.

දුරකථන : 011-2456485, 0112-456479

එන්. ටී. හේවාමලවි,<br>
රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,<br>
දිසා අධිකරණය - හිඟුරක්ගොඩ.

වර්ෂ 2021ක් වූ අගෝස්තු මස 05 වැනි දින දී ය.

09-116

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.